# සමනල යාලුවා



ඔනාදි ලිමන්සා මුතුකුඩහේරත්

# සමනල යාලුවා

## ඔනාදි ලිමන්සා මුතුකුඩහේරත්

කතෘ

පළමු දිගහැරීම

මහ/ මහමායා බාලිකා විදුහල

2 ශ්‍රේණිය E

2026.05.10

ISBN 978-624-211-464-4

## පිදුම

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ ගරු

විදුහල්පතිතුමියටත් ,

ප්‍රාථමික අංශයේ ගරු විදුහල්පතිතුමියටත්

මාගේ පන්තිභාර ගුරුතුමියටත්

හේමමාලා ග්‍රන්ථ ව්‍යාපෘතියේ සම්බන්ධීකාරක ගුරු

පියාණන්ටත් මාගේ ආදරණීය දෙමාපියන්ටත්

මහාමායාවේ ආදරණීය සහෝදරියන්ටත් සෙනෙහසින්

පුදමි. !



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා  සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

එකමත් එක ගමක ටිකිරි කියලා පොඩි ගෑනු ළමයෙක් හිටියා. එයාට හිතුණා එයාගේ මිදුලේ මල් හදලා ලස්සන කරන්න.



ටිකිරි එයාගෙ මිදුලේ ලස්සන මල් පැලයක් හැදුවා. මල් පඳුරේ ලස්සනට මල් පිපිලා තිබුනා.



එක දවසක් ලස්සන සමනලයෙක් මේ මල් වල පැණි බොන්න ආවා දැකලා ටිකිරි ගොඩක් සතුටු වුනා. ටිකිරි සමනලයත් එක්ක හිනා වුනා.  සමනලයත්  ටිකිරි එක්ක හිනා උනා.



ඊළඟ දවසේ උදෙන්ම ටිකිරි මල් පඳුර ළඟට ගියා. එදත් අර සමනලයා ඇවිත් හිටියා. “සුභ උදෑසනක් බබා” සමනලයා කීවා. “සුභ උදෑසනක් සමනලයෝ” ටිකිරිත් කීවා. මේ මල් හැදුවාට ඔයාට ගොඩාක් ස්තුතියි බබා” සමනලයා කීවා.

ටිකරිට සතුටු හිතුණා..



ටිකිරි තවත් මල් පැළ හැදුවා. සමනලයාත් හැමදාම  මල් පැණි බොන්න ආවා. ටික දවසකට පස්සේ අළුත් මල් ගස් වලත් මල් පිපුණා.



සමනල යාළුවා තවත්  සමනලයෙක් එක්කගෙන ආවා.

"මේ මගේ නංගි. එයාටත් මල් පැණි බොන්න දෙනවාද"

සමනල  යාළුවා ඇහුවා.



“ඔයාල දෙන්නම පැණි බොන්න. මම ඔයාලට ගොඩක් ආදරෙයි සමනලයෝ” ටිකිරි කීවා.

“ ඔයාට බොහොම ස්තූතියි ටිකිරි” සමනලයො දෙන්නම කීවා. ඊට පස්සේ සමනලයෝ දෙන්නම සතුටින් මල් පැණි බිව්වා.



එක දවසක් උදේ හයියෙන් වහින්න පටන් ගත්තා. ටිකිරි මිදුල දිහා බලාගෙන හිටියා. වෙනදා උදේ මල් පැණි බොන්න එන සමනලයෝ දෙන්නා හිටියේ නෑ. ටික වේලාවකින් එක් සමනලයේ කලබලයෙන් ටිකිරි ළඟට



“අනේ ටිකිරි මගේ අක්කා මල් පැණි බොන්න එන අතරමගදි වැස්සට අහුවෙලා බිමට වැටුනා”

“ඔයාට පුළුවන්ද අපිට උදව් කරන්න”. සමනල යාළුවා ඇහුවා.

“අනේ ඔව්. අපි යමු බලන්න”. ටිකිරි සමනලයාත් එක්ක වත්තෙන් එලියට ගියා



ගසක් මුල වැටිලා හිටිය සමනලයාගේ තටු තෙමිලා නිසා පියාඹන්න බැරිව හිටියා. ටිකිරිට දුක හිතුණා.

ටිකිරි සමනලයාව හිමින් කොළයක් උඩට අරගෙන ගෙදර අරන් ගියා. අනෙක් සමනල යාළුවාත් ටිකිරි එක්ක ගෙදර ආවා.



ටිකිරි පොත් මේසේ උඩින් සමනලයා වේලෙන්න තිබ්බා. ටික වේලාවක් යනකොට සමනලයාගේ තෙමුණ තටු වේළුණා.



එළියේ වැස්ස පායලා තිබුණා. ටිකිරි සමනලයාව සෙමෙන් අතට අරගෙන එළියට අරන් ගියා. සමනලයාට ආයෙත් පියාඹන්න පුළුවන් වුණා.

"ගොඩක් ස්තූතියි ටිකිරි. ඔයා අපිට උදව් කළාට" සමනලයො දෙන්නාම කීවා. ටිකිරිට හරිම සතුටුයි. අනෙක් අයට කරදරයකදී උදව් කරන්න පුලුවන් උනාට.

සමනලයො දෙන්නා හැමදාම ආයෙත් මල් පැණි බොන්න ආවා.



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)